ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 18/05/2021

පැමිණිලි පාර්ශවය :- ආර්. ඒ. ජයවීර රණවක මහතා,
අංක 132 , 66, දඹදෙණිය,
මහඔය.

වගඋත්තර පාර්ශවය :- පොලිස් පරීක්ෂක - බී.කේ. චන්දන වීරසිරි මයා,
පොලිස් ස්ථානය,
මහඔය.

පැමිණිලි අංකය :- HRC/AM/22/20/B/PL

**පැමිණිල්ලේ සැලකිරීම :-**

ඉහත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනුකරමින්, 2020.09.22 වන දින තමා පානය කිරීමට ගෙනෙන ලද කසිප්පු 1/8 ක් පමණ පදිංචි නිවස තුළ තිබියදී මහඔය පොලිසියෙන් අල්ලා ගත් බවත්, ඉන් පසුව අයි. පී. චන්දන නැමැති පොලිස් නිළධාරි තමා නිවසේ සිට පාළු ස්ථානයකට රැගෙන ගොස් නිර්වස්ත්‍ර කර වේවැලකින් පිටුපස ප්‍රදේශයට පහර දෙමින් කසිප්පු පෙරන ලද දගර හා බැරල් ආදිය ඉල්ලා සිටි බවත්, අනතුරුව තමා පොලිසියට රැගෙන ගොස් දෙදෙනෙකු තමාගේ අත අල්ලා සිටියදී නැවත එම නිළධාරියා පහරදුන් බවත්, පොලිස් ස්ථානයේදී බලහත්කාරයෙන් ගොඩා බෝතල් ½ බීමට ලබා දුන් බවත් පවසා ඇත. අනතුරුව තමා මහඔය රෝහලේ වෛද්‍යවරයෙකු වෙත යොමු කිරීමෙන් පසුව රාත්‍රී 9.00 ට පමණ ඇප ලබා දුන් බවත්, පසුදින උදේ පහරදීමෙන් වූ තුවාල වේදනා ගෙන දෙන බැවින්, ඒ පිළිබඳව සහකාර පොලිස් අධිකාරි, මහඔය වෙත දැන්වීමෙන් පසුව ඔහුගේ උපදෙස් පරිදි නැවත වෛද්‍යවරයා වෙත යොමු වූ බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු 2020.06.16 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ, අම්පාර ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණ ප්‍රකාශයක් ලබා දෙමින් තමා ඇප දීමට ප්‍රථම වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමේදී වෛද්‍යවරයාට පැවසුව හොත් ඇප ලබා නොදෙන බවට අයි. පී. චන්දන නිළධාරියා කළ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrc@gmail.com

තර්ජණය නිසා පහරදීමක් සිදු වූ බව වෛද්‍යවරයාට නොපැවසූ බවද පවසා ඇත. එසේම තමාට පහරදුන් වේවැල අදාළ පාළු ඉඩමේ දමා ගොස් තිබියදී තමාට හමු වූ බවද ප්‍රකාශ කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැලකිරීම් :-**

බද්දේගම කම්කානම්ලාගේ චන්දන වීරසිරි, පොලිස් පරීක්ෂක, මහඔය පොලිස් ස්ථානය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබාදෙමින්, 2020.04.22 වන දින පැය 15.15 ට කසිප්පු බෝතල් 10 ක් සමග ජයවීර රණවක නොහොත් මහත්තයා යන අය අත්අඩංගුවට ගෙන ස්ථානයේ නඩු බඩු කුවිතාන්සි අංක 274 යටතේ ලේඛන ගත කර මහඔය පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බව දක්වා ඇත.

අදාළ සැකකරු ඔහුගේ නිවසේ සිටියදී අත්අඩංගුවට ගත් බවත්, තමා සමහ උ.පො.ප. චතුරංග, පො.සැ. 54272 සිසිර, 13814 ගුණරත්න, 40353 පුෂ්පකුමාර, 63048 සමරකෝන්, 73445 කුමාර, 71814 රාජපක්ෂ, 38117 ජයසූරිය, 37326 බස්නායක, 74688 නුවන්, 29628 හේරත්, කා.පො.සැ. 2490 ඉන්දිමා, කා.පො.කො. 6517 නයනා, සි.ආ.බ. 37867 ප්‍රදීප්, සි.ආ.බ. 008568 සිරිපාල යන නිළධාරීන් සහභාගී වූ බවත් පවසා ඇත. අත්අඩංගුවට ගත් සැකකරු පැය 16 ට ස්ථානයට ඉදිරිපත් කර නඩු බඩු කුවිතාන්සි අංක 273/20 යටතේ ලේඛනගත කර උප සේවා නිළධාරී පො.කො. 69731 සමරසේකර නිළධාරියාට භාරදුන් බවත්, ඔහුගේ ප්‍රකාශ සටහන් කිරීම පැය 19/45 ට පො.සැ. 54272 සිසිර නිළධාරියා විසින් සිදුකිරීමෙන් අනතුරුව පැය 20 ට සැකකරු මහඔය රෝහලේ අධිකරණ වෛද්‍ය නිළධාරී වෙත පො.කො. 74688 නුවන් විසින් රැගෙන ගොස් ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත.

වෛද්‍යවරයා පරීක්ෂා කිරීමෙන් පසුව පැය 20.25 ට ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් පසුව පැය 20.30 ට සැකකරුට ඇප ලබා දී ඇති බවත් පවසා ඇත.

අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමේදී සැකකරු තමාට පහරදීමක් සිදු වූ බවට කිසිම සටහනක් කර නොමැති අතර, අධිකරණ වෛද්‍ය පෝරමය අනුවද (අංක 6520) පහරදීමක් සම්බන්ධයෙන් කිසිදු සටහනක් නොමැති බවත්, සැකකරු අත්අඩංගුවට ගෙන ඇප මත මුදාහරින තෙක් තමා විසින් කිසිදු පහරදීමක් සිදු නොකල බවත්, මීට පෙරද මොහු විවිධ වරද සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම හේතුවෙන් මෙසේ අසත්‍ය චෝදනා නගා ඇති බව තමා විශ්වාස කරන බවත්, ඇප ලබා ගැනීමෙන් අනතුරුව කිසියම් පිරිසක් හා ආරවුලක් සිදුකරගෙන තමා හා ඇති අමනාපය නිසා මෙම අසත්‍ය පැමිණිල්ල ගොනුකර ඇති බවද පවසා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වන කරුණු :-**

රණවක ආරච්චිලාගේ ජයවීර රණවක යන අය 2020.09.22 වන දින පැය 15.15 ට විරාඩිය හංදියේදී නීතිවිරෝධී මත්පැන් වන කසිප්පු මි.ලි. 7500 ක් ළඟ තබාගැනීමේ වරදට පොලිස් පරීක්ෂක චන්දන වීරසිරි මහතා විසින් අත්අඩංගුවට ගෙන ඇති බව මහඔය පොලිස් ස්ථානයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති පොලිස් උධෘත අනුව අනාවරණය වේ.

පැමිණිලිකරු 2020.04.22 වන දින පැය 20.00 ට මහඔය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති නියෝග හා උපදෙස් අනුව පො.සැ. 54272 සිසිර හා පො.කො. 74680 නුවන් යන අය අධිකරණ වෛද්‍ය පෝරම 65/20 සමඟ මහඔය රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති බව පොලිස් උධෘත අනුව අනාවරණය වේ. එසේම 2020.09.22 වන දින පැය 20.30 ට පොලිස් ඇප ලබා දී ඇති බවද පොලිස් උධෘත අනුව අනාවරණය වේ.

අධිකරණ වෛද්‍ය පෝරම 65/20 අනුව පැමිණිලිකාර ආර්.ඒ. ජයවීර රණවක යන අයට පහරදීමක් සිදු නොවන බව අනාවරණය වේ.

අධිකරණ වෛද්‍ය නිළධාරී වෛද්‍ය එල්.එස්.එල්. ලියනගේ මහතා, මහඔය රෝහල විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අධිකරණ වෛද්‍ය වාර්ථා දෙකක් යොමුකර ඇත. අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පත්‍ර අංක 65/2020 ට අනුව රෝගියා, පොලිස් නිළධාරීන් තමාට පහර නොදුන් බව ප්‍රකාශ කර ඇති අතර, එහි තුවාල සටහන් කිසිවක්ද නැති බව අනාවරණය වේ. වෛද්‍යවරයා සඳහන් කර ඇත්තේ, 2020.04.22 ප.ව. 8.14 ට ආර්.ඒ. ජයවීර රණවක යන අයගේ කිසිදු තුවාලයක් දක්නට නොලැබුණු බවත්, 2020.04.23 ප.ව. 12.20 ට පරීක්ෂණයේදී තුවාල දක්නට ලැබුණු බවත්, ඒ අනුව එම තුවාල 2020.04.22 රාත්‍රී 8-14 ට පසුව සිදුවූ ඒවා බව සටහන් කර ඇති බව අනාවරණය වේ.

අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පත්‍ර අංක 66/20 අනුව කළ පරීක්ෂණයේදී රෝගියා 2020.04.22 පැය 3.30 ට පමණ තමා අත්අඩංගුවට ගැනීමේදී පොලිස් නිළධාරීන් පාළු ස්ථානයකට රැගෙන ගොස් වේවැලකින් පහර 15/20 ක් පමණ ගැසූ බවත් පොලිස් ස්ථානයේදී පහරදුන් බවත්, ඉනෙන් පහලට පහරදුන් බවත් පවසා ඇත. ඒ අනුව කළ පරීක්ෂණයේදී බරපතල නොවන තුවාල 04 ක් සටහන් කර ඇත. අදාළ තුවාල දිග කෝටුවකින් පහරදීමකින් ඇති වූ ඒවා බවද, ඒවා රෝගියා විසින් දෙන ලද රෝග ඉතිහාසය හා ගැලපෙන බවද, සටහන් කර ඇති බව අනාවරණය වේ.

**නිරීක්ෂණ හා නිගමනය :-**

ඉහත අනාවරණය වන කරුණු අනුව පැමිණිලිකාර ආර්.ඒ. ජයවීර රණවක යන අය 2020.04.22 වන දින පැය 15.15ට පොලිස් අත්අඩංගුවට පත්ව එදින පැය 20.30 ට ඇප ලබා දී ඇති අතර, ඇප ලබා දීමෙන් අනතුරුව 2020.04.23 පැය 8.00 වන විට සහකාර පොලිස් අධිකාරි කාර්යාලය වෙත පහරදීම සම්බන්ධව පැමිණිලි කිරීමට ගොස් ඇති බව නිරීක්ෂණය වේ. එම කාල සීමාව තුල ඔහු වෙනත් පාර්ශවයක් සමඟ ගැටුමක් ඇති කර ගත් බවට පොලිස් ස්ථානය වෙත වාර්ථා වීමක්ද සිදුව නැත.

ඒ අනුව ඔහුට ඇති වී ඇති තුවාල පො.ප - බී.කේ. චන්දන වීරසිරි මහතා විසින් පහරදීම නිසා සිදුවූ තුවාල බව පැහැදිලි වේ. 2020.04.22 දිනැති වෛද්‍ය වාර්ථා අංක 65/20 තුවාල සලකුණු නොමැති බවට සටහන්ව ඇත. පැමිණිලිකරු පවසන පරිදි තමාට ඇප ලබා නොදෙන බවට කළ බලපෑම් මත ඔහුට පහරදීමක් සිදු නොවූ බව වෛද්‍යවරයාට පැවසූ හෙයින් ඔහු සම්පූර්ණ පරීක්ෂාවකට ලක් වී නොමැති වීම එයට හේතුව බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම ඔහුගේ පසුපස ප්‍රදේශයට පහරදීම සිදු වී ඇති අතර, සම්පූර්ණ ශරීරය පරීක්ෂා කිරීමක් නොවුනේ නම්, එම තුවාල පරීක්ෂාවට ලක් නොවේ.

2020.04.23 දිනැති 66/20 වෛද්‍ය වාර්තාව පැමිණිලිකරු සහකාර පොලිස් අධිකාරි කාර්යාලය වෙත පහරදීම පිළිබඳව පැමිණිලි කිරීමෙන් පසුව එම කාර්යාලය මගින් වෛද්‍යවරයා වෙත යොමු කිරීමෙන් අනතුරුව ලබා ගත් එකකි. එහිදී පැමිණිලිකරු තමාට පො.ප. චන්දන වීරසිංහ මහතා පහර දුන් බව පවසා තුවාල වෛද්‍යවරයාට පෙන්වා ඇත. එම තුවාල රෝගියා ලබාදුන් රෝග ඉතිහාසය හා ගැළපෙන බවද වෛද්‍යවරයා කොමිෂන් සභාවට ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන ලෙස කළ දැන්වීම අනුව කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

තවද පැමිණිලිකරු විසින් පැමිණිල්ල ඉල්ලා අස්කර ගත්තද <u>වන්නිනායක මුදියන්සේලාගේ හේරත් බංඩා මොරගොල්ලාගම එරෙහිව උ.පො.ප , වස්ගියවත්ත, පොලිස් ස්ථානය, පොල්පිතිගම හා තවත් අය</u> SCFR (270/93) නඩුවේදී දක්වා ඇත්තේ, නඩු ඉල්ලා අස්කරගැනීමේ හැකියාව ඇති නමුත්, වෛද්‍යමය කරුණු මගින් වධහිංසාවට ලක්කිරීම සිදුකර ඇති බව තහවුරු කර ඇති අවස්ථාවල එම ඉල්ලා අස්කරගැනීමට ඉඩදිය නොහැකි බවයි.

මෙම සියලු කරුණු අනුව, පැමිණිලිකරුට පො.ප. චන්දන වීරසිංහ මහතා පහරදීමක් සිදු කර ඇති බව අනාවරණය වේ. ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත රු. 15,000/-ක මුදලක් ගෙවිය යුතුය.

02. වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති, සහ සභාපති, පොලිස් කොමිෂන් සභාව වෙතද යොමුකරන බවද දන්වා සිටිමි.

2021. 06. 21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති.
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07.

B/